# Holiday Assignments - 2020

Sinhala Junior Section

Subject – Sinhala | Grade 8 | Medium - Sinhala

උපදෙස්

8sE සඳහා සිංහල පැවරුම-(සිංහල විෂය භාර ගුරුතුමිය)

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

මාතෘකා 03ටම රචනා ලියන්න.

## I කොටස

**සැලකිය යුතුයි.**

- ප්‍රශ්න **සියල්ලටම** පිළිතුරු සපයන්න.

* **තද කළු අකුරින්** මුද්‍රිත ඉඟි වැකිවල අදහසට වඩාත් සමීප පිළිතුර **යටින් ඉරි** අඳින්න.

01. කාට හෝ උපකාරයක් අවශ්‍යම මොහොතක **කර ඇරීම** සුදුසු නැතැයි තාත්තා කියන්නේ, ගමේ බොහෝ දෙනා විපතකදී පිහිට පතා එන විට ය.
    (1) කරට ගොඩ වීම (2) පිටත් කර හැරීම
    (3) බැණ වැදීම (4) මග හැරීම

02. නගරයේ කල්ලි ගැසී විවිධ අකටයුතුකම් කළ කණ්ඩායමට නායකත්වය දුන් නමුත්, දැන් ඔහුගේ **පොරකටු ගෙවිලා** යැයි කවුරුත් කියති.
    (1) බලය පිරිහී ඇති බව (2) දුර්වල වී ඇති බව
    (3) මුදල් නැති බව (4) බිය වී ඇති බව

* **මුලින් දී ඇති පදවල අරුත** නිවැරදිව පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.

03. කිරි මුවා , කිරි කොකු , කිරි පද්ද , කිරිංචි
    (1) මැණික් විශේෂයක්, කිරි පෙරහන, සුදු පැහැති වළලු විශේෂයක්, උල් පිහිය
    (2) ගණදෙවියා, සුදු පැහැති වළලු විශේෂයක්, කිරි පෙරහන, මැණික් වෙසෙසක්
    (3) ගණදෙවියා, සුදු පැහැති වළලු විශේෂයක්, මැණික් වෙසෙසක්, කිරි පෙරහන
    (4) සුදු මුවා, සුදු පැහැති වළලු විශේෂයක්, කිරිබත්, මැණික් වෙසෙසක්

04. ධ්‍රැව, තෙලිතුඩ, දසන, අමාවක
    (1) දියරය, පෑන, දර්ශනය, මාසේ පෝය දවස
    (2) පෘථිවි අක්ෂයේ උතුරු දකුණු තුඩු, පෑන, දත්, පෝය දවස
    (3) තරලය, පින්සලෙහි අග, දසුන, මාසේ පෝය දවස
    (4) පෘථිවි අක්ෂයේ කෙළවර ලක්ෂ්‍ය, පින්සලෙහි අග, දත, අව පසළොස්වක

* **ඉරි ඇඳි පදයේ අරුත** ඇති පිළිතුර තෝරන්න.

05. වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා ආදිය **යල් පිනූ** අදහස් යැයි අවඥාවෙන් බැහැර නොකළ යුතු ය.
    (1) නිරර්ථක (2) ආවිර්ණ කල්පිත
    (3) පෞරාණික (4) පුරාණෝක්ති

06. උද්‍යානය පුරා විසිරුණු තුරු අතුපතර **ඉදුණු** පලතුරු සුවඳට ඇදෙන ගිරවුන් ය.
    (1) විලවුන් (2) විලසින් (3) විලිකුන් (4) විළිබර

* **අකාරාදි පිළිවෙළට** පෙළගස්වා ඇති නිවැරදි පිළිතුර තෝරන්න.

07. (1) මාතර, ගාල්ල, හම්බන්තොට, කොළඹ, යාපනය
    (2) ගාල්ල, කොළඹ, හම්බන්තොට, මාතර, යාපනය
    (3) කොළඹ, ගාල්ල, මාතර, යාපනය, හම්බන්තොට
    (4) කොළඹ, ගාල්ල, මාතර, හම්බන්තොට, යාපනය